මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාව

අදාළ කාලපරිච්ඡේදය: 2025 වසරේ හතරවන සහ 2026 වසරේ පළමුවන කාර්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2026 මැයි මාසය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26(5) වගන්තිය සපුරාලමින්, 2025 වසරේ හතරවන සහ 2026 වසරේ පළමුවන කාර්තුවල දී අනුක්‍රමික කාර්තු දෙකක් සඳහා කාර්තුමය මතුපිට උද්ධමනය මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි සඳහන් කර ඇති උද්ධමන ඉලක්කයට ප්‍රතිශතාංක දෙකක ආන්තිකයට වඩා පහළින් පැවතීම හේතුවෙන් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ගරු මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව.

- මෙම පිටුව හිස්ව තබා ඇත -

මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාව

අදාළ කාලපරිච්ඡේදය: 2025 වසරේ හතරවන සහ 2026 වසරේ පළමුවන කාර්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව | 2026 මැයි මාසය

---

1. හැඳින්වීම

1.1. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ (මෙතැන් සිට මහ බැංකු පනත ලෙස හැඳින්වේ) 26(1) වගන්තිය යටතේ ගරු මුදල් අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර 2023 ඔක්තෝබර් 03වන දින අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමට අනුව,[1] ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) මගින් මනිනු ලබන කාර්තුමය මතුපිට උද්ධමනය,[2] 5%ක මට්ටමේ පවත්වාගෙන යෑමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇත. තවද, මහ බැංකු පනතේ 26(5) වගන්තියට අනුව, මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කය, එම ගිවිසුමෙහි දක්වා ඇති නිශ්චිත ආන්තිකයෙන් අනුක්‍රමික කාර්තු දෙකක් තුළදී සපුරා ගැනීමට මහ බැංකුව අපොහොසත් වුවහොත්, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් උද්ධමන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වීමට හේතු, මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට ගතවන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් සහිත වාර්තාවක් ගරු මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, එය මහජනතාවට ද ලබා ගත හැකි විය යුතුය. මහ බැංකු පනතේ 26(5) වගන්තිය සඳහා අදාළ වන ආන්තිකය ප්‍රතිශතාංක ±2ක් බව මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි සඳහන් වේ.

1.2. ප්‍රකාශිත දත්ත අනුව, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනයේ කාර්තුමය සාමාන්‍යය 2025 වසරේ හතරවන කාර්තුවේ දී 2.1%ක් සහ 2026 වසරේ පළමු කාර්තුවේ දී 2.0%ක් ලෙස වාර්තා විය.[3] උද්ධමනය, අනුක්‍රමික කාර්තු දෙකක් සඳහා 5%ක උද්ධමන ඉලක්කයට ප්‍රතිශතාංක 2කට වඩා පහළින් පැවති බැවින් (එනම්, 3.0%ට වඩා පහළින්), මහ බැංකු පනතේ 26(5) වගන්තිය යටතේ දක්වා ඇති අවශ්‍යතාව පරිදි මෙම වාර්තාව

---

[1] 2023 ඔක්තෝබර් 05 දිනැති අංක 2352/20 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

[2] කාර්තුමය මතුපිට උද්ධමන අනුපාතිකය යනු අදාළ කාර්තුවේ මාස තුන සඳහා මාසික මතුපිට කො.පා.මි.ද. හි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස්වීම්වල සරල සාමාන්‍යය වේ.

[3] මැදපෙරදිග කලාපයේ පවතින යුදමය තත්ත්වයේ බලපෑම්, විශේෂයෙන් දේශීය බලශක්ති මිල ගණන් ඉහළ යෑම පෙන්නුම් කරමින්, 2026 අප්‍රේල් මාසයේ දී කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 5.4%ක් දක්වා ඉහළ ගියේය

ඉදිරිපත් කෙරේ. 2024 වසරේ අවසාන කාර්තු තුනෙහි සහ 2025 වසරේ කාර්තු හතරෙහිම කාර්තුමය මතුපිට උද්ධමනය ඉලක්කගත මට්ටමට වඩා පහළින් පැවතීම හේතුවෙන්, මේ හා සමාන වාර්තා 2024 වසරේ දෙසැම්බර්, 2025 වසරේ මාර්තු, ජූනි, අගෝස්තු, දෙසැම්බර් සහ 2026 වසරේ මාර්තු මාසයේ දී ඉදිරිපත් කෙරුණි.[4] ඒ අනුව, කාර්තුමය මතුපිට උද්ධමනය 2026 වසරේ පළමුවන කාර්තුවේ දී ද උද්ධමන ඉලක්කයට වඩා පහළ අගයක පැවතීම හේතුවෙන්, මෙම වාර්තාව පෙර ඉදිරිපත් කරන ලද වාර්තාවලට අනුබැඳුමක් ලෙස ක්‍රියා කරයි.

1.3. 2024 වසරේ දෙවන කාර්තුවේ සිට කාර්තුමය මතුපිට උද්ධමනය අඛණ්ඩව ඉලක්කගත මට්ටමට ප්‍රතිශතාංක 2කට වඩා පහළ අගයක් (එනම්, 3.0%ට වඩා පහළ අගයක්) වාර්තා කළ අතර, යටිදැරි ඉල්ලුම මත පදනම් වූ මිල පීඩන යථා තත්ත්වයට පත්වීම මන්දගාමීව සිදු වීම මධ්‍යයේ සැපයුම් අංශයේ හටගත් සැලකිය යුතු මට්ටමේ නිර්-උද්ධමනකාරී කම්පන මාලාවක් ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2024 වසරේ මුල් භාගයේ සිට මැද භාගය දක්වා කාලයේ දී උද්ධමනය පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන්, 2024 වසරේ මාර්තු සහ ජූලි මාසවල දී විදුලි ගාස්තු අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩි අගයකින් පහළ දමමින් සිදු කළ මිල සංශෝධන සමඟ දේශීය ඉන්ධන සහ LP ගෑස් මිල ගණන් පහළ දැමීම හේතු වූ අතර, එමගින් කො.පා.මි.ද.හි බලශක්ති සහ ප්‍රවාහන සංරචකවල මිල ගණන් සැලකිය යුතු අයුරින් පහළ ගියේය. 2024 වසරේ දී ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම හේතුවෙන් ආනයන පිරිවැය සහ සමස්ත ආනයන උද්ධමනය පහළ යෑම මෙන්ම එම වසරේ දී ආහාර මිල ගණන් පහළ යෑම ද මෙම නිර්-උද්ධමනකාරී තත්ත්වය සඳහා තවදුරටත් සහාය විය. අනතුරුව, බලශක්ති ආශ්‍රිත මිල ගණන් අඛණ්ඩව අඩු මට්ටමක පැවතීම සහ 2024 මුල් භාගයේ දී එකතු කළ අගය මත බදු ආශ්‍රිත මිල ගණන් ඉහළ දැමීම සම්බන්ධ හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම් 2024 වසර අවසාන කාලයේ දී සහ 2025 වසර මුල් කාලයේ දී නිරීක්ෂණය කළ අවධමනකාරී තත්ත්වය තීව්‍ර වීම සඳහා දායක විය. ඒ අනුව, මෑත කාලීන අවධමන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ වඩාත්ම තීව්‍ර කාර්තුමය අවධමන මට්ටම 2025 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා විය. එතැන් සිට, පෙර පැවති මිල පහළ දැමීම් ආශ්‍රිත බලපෑම් ක්‍රමයෙන් පහව යෑමත් සමඟ මතුපිට අවධමනය ක්‍රමයෙන් ලිහිල් වී ධන අගයකට පත්විය. 2025 වසරේ ජූනි මාසයේ දී විදුලි ගාස්තු ඉහළ දමමින් මිල සංශෝධනය කිරීම සහ ඇතැම් ආහාර අයිතමවල මිල ගණන් ඉහළ යෑම මෙන්ම දේශීය ඉල්ලුම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම ද මෙම ප්‍රවණතාව සඳහා සහාය විය. කෙසේ වුවද, උද්ධමනය යථා තත්ත්වයට පත් වීමේ වේගය පෙර අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා මන්දගාමී මට්ටමක පවතින අතර, මූලික උද්ධමනය මගින් තවදුරටත් අඩු යටිදැරි ඉල්ලුම් පීඩන පෙන්නුම්

[4] මතුපිට උද්ධමනය ඉලක්කගත උද්ධමනයෙන් අපගමනය වීම පිළිබඳ මින් පෙර ඉදිරිපත් කළ වාර්තා වෙත https://www.cbsl.gov.lk/si/මුදල්-ප්‍රතිපත්තිය/මුදල්-ප්‍රතිපත්ති-සන්නිවේදනය/පාර්ලිමේන්තුවට-වගවීම සබැඳිය ඔස්සේ ප්‍රවේශ විය හැකිය.

කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, කාර්තුමය මතුපිට උද්ධමනය 2026 වසරේ පළමු කාර්තුව දක්වාම අඛණ්ඩව ඉලක්කගත මට්ටමට වඩා පහළ අගයක පැවතුණි.

1.4. ඉහත දක්වා ඇති පරිදි, විශේෂයෙන් 2025 වසරේ හතරවන සහ 2026 වසරේ පළමුවන කාර්තුව සලකා බැලීමේ දී, මතුපිට උද්ධමනය අඛණ්ඩව පහළ ධන මට්ටම්වල පැවතුණි. කාර්තු දෙකෙහිම උද්ධමනය 3%ට වඩා පහළින් පැවතීම හේතුවෙන් ඉලක්කගත මට්ටමෙන් පහළින් අපගමනය වීමක් වාර්තා කරන ලදී. දිට්වා සුළි කුණාටුව ආශ්‍රිත බාධා මගින් 2025 වසරේ හතරවන කාර්තුවේ දී උද්ධමනය කෙරෙහි ඇති වූයේ සීමිත බලපෑමක් පමණි. කෙසේ වුවද, මැදපෙරදිග යුද්ධය 2026 වසරේ පළමුවන කාර්තුව අවසාන කාලයේ සිට උද්ධමනය කෙරෙහි බලපෑම් එල්ල කරන ලදී. 2026 වසරේ මාර්තු මාසයේ දී 2.2%ක් ලෙස වාර්තා වූ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය එම වසරේ අප්‍රේල් මාසය වනවිට 5.4%ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, එමගින් ප්‍රධාන වශයෙන් මැදපෙරදිග යුදමය තත්ත්වය මුල්කර ගනිමින් බලශක්ති මිල ගණන් ඉහළ යෑමේ බලපෑම් පිළිඹිබු කෙරේ. 2026 වසරේ මාර්තු මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී නිකුත් කරන ලද පුරෝකථන මගින්, 2026 වසරේ දෙවන කාර්තුවේ දී මතුපිට උද්ධමනය ඉලක්කගත මට්ටමට ළඟා වී, සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහාය ඇතිව මැදි කාලීනව උද්ධමන ඉලක්කය වටා ස්ථායීව පවතිනු ඇතැයි පෙන්නුම් කරයි. මැදපෙරදිග යුද්ධයේ නිරන්තර වෙනස්වන ස්වභාවය සහ එමගින් දේශීය සහ ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි එල්ලවිය හැකි පුළුල් වක්‍ර බලපෑම් සැලකිල්ලට ගත් විට, වත්මන් සාර්ව ආර්ථික ඉදිරි දැක්ම මත වූ අවිනිශ්චිතතා තවදුරටත් ඉතා ඉහළ මට්ටමක පවතී. පුරෝකථන සඳහා පදනම් වූ තත්ත්වයන්හි සැලකිය යුතු වෙනස්කම් සිදුවුවහොත් මෙම පුරෝකථන සැලකිය යුතු අයුරින් වෙනස් වීමට හේතු විය හැකිය.

2. උද්ධමනය ඉලක්කගත මට්ටමෙන් අපගමනය වීමට හේතු

සමස්ත ඉල්ලුම යථා තත්ත්වයට පත්වීම මන්දගාමීව පැවතුණු තත්ත්වයක් මධ්‍යයේ, මෑත කාලීනව උද්ධමනය කෙරෙහි සැපයුම් අංශයේ සාධක වැඩි වශයෙන් බලපා ඇත. පෙර ඉදිරිපත් කළ වාර්තාවල දක්වා ඇති පරිදි, විදුලි ගාස්තු, ඉන්ධන සහ LP ගෑස් මිල ගණන් ආශ්‍රිතව සිදු කළ සංශෝධන මෙන්ම ආහාර මිල ගණන් ආශ්‍රිත වෙනස්වීම් 2024 වසරේ අවසන් කාර්තු තුනෙහි සහ 2025 වසරේ කාර්තු හතරෙහිම උද්ධමන ගමන් මග කෙරෙහි බොහෝ දුරට බලපා ඇත. සැලකිය යුතු කාලපරිච්ඡේදයක් පුරා ගෝලීය ඛනිජ තෙල් මිල ගණන් සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවතීම මෙන්ම ඇතැම් කාලවලදී පැවති හිතකර කාලගුණ තත්ත්වයන් හේතුවෙන් ජල විදුලි උත්පාදනය සාපේක්ෂව ඉහළ යෑම මෙම විචලනයන් සඳහා ප්‍රධාන වශයෙන් සහාය විය. විනිමය අනුපාතිකයේ සිදු වූ වෙනස්වීම් ද උද්ධමනය කෙරෙහි බලපා ඇති අතර, එය ප්‍රධාන වශයෙන්ම ආනයනික මිල ගණන් සහ දේශීය පිරිවැය තත්ත්වයන් කෙරෙහි බලපෑම් ඇති කිරීම හරහා සිදුවිය. මිල සංශෝධන සහ ඒවා සිදුවන කාලසීමාවන් සැලකිය යුතු ලෙස වෙනස් වීම හේතුවෙන්, විශේෂයෙන්ම විදුලි ගාස්තු ඇතුළු ඇතැම් අපේක්ෂිත මිල වෙනස් කිරීම නිවැරදිව පුරෝකථනය කිරීම අභියෝගාත්මක වී ඇත. පුරෝකථන සකස් කිරීමේ දී පදනම් කරගත් උපකල්පනවලින් වාර්තා වූ ගාස්තු සංශෝධන වෙනස්වීම, වාර්තා වූ

උද්ධමනය පුරෝකථනවලින් අපගමනය වීම සඳහා අර්ධ වශයෙන් දායක විය.[5] මීට පෙර ඉදිරිපත් කළ වාර්තා මගින් මෙම සාධක පැහැදිලි කර ඇති බැවින්, 2026 වසරේ පළමුවන කාර්තුවේ දී ද උද්ධමනය ඉලක්කගත මට්ටමෙන් අඛණ්ඩව අපගමනය වීම පිළිබඳව මෙම වාර්තාව මගින් අවධානය යොමු කෙරේ.

2.1. අපේක්ෂා කළ පරිදි, 2026 වසරේ පළමුවන කාර්තුවේ දී උද්ධමනය අඛණ්ඩව පහළ ධන අගයක මට්ටමේ පැවතුණි. කෙසේ වුවද, 2025 වසරේ හතරවන කාර්තුවට සාපේක්ෂව 2026 වසරේ පළමුවන කාර්තුවේ දී කාර්තුමය මතුපිට උද්ධමනයේ සුළු පහළ යෑමක් වාර්තා විය. උද්ධමනය ඉහළ යෑම ආරම්භ වූ 2025 වසරේ මුල් කාලයේ සිට මාසික වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය ඉහළ යෑමේ ප්‍රවණතාවක් පැවතිය ද, 2026 වසරේ පෙබරවාරි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සුළු වශයෙන් අඩු වීම මෙම පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. බලශක්ති සහ ඉන්ධන කාණ්ඩයේ පැවති අවධමනකාරී පීඩන තවදුරටත් ලිහිල් වීමත් සමඟ, එම කාණ්ඩය මගින් මතුපිට උද්ධමනය සඳහා දක්වන දායකත්වය 2026 වසරේ පළමුවන කාර්තුවේ දී ධන මට්ටමකට පත්විය. කෙසේ වුවද, පෙර කාර්තුවල දී ආහාර සහ මද්‍යසාර නොවන පාන වර්ග කාණ්ඩය මතුපිට උද්ධමනය සඳහා සාපේක්ෂ වශයෙන් සැලකිය යුතු ධනාත්මක දායකත්වයක් දක්වා තිබුණ ද, 2026 වසරේ පළමුවන කාර්තුවේ දී එය සැලකිය යුතු අයුරින් පහළ ගිය අතර, විශේෂයෙන් 2026 වසරේ පෙබරවාරි සහ මාර්තු මාසවල දී ඇතැම් ආහාර අයිතමවල මිල ගණන් අඩු වීම සහ සංඛ්‍යානමය පදනම් බලපෑම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. සේවා කාණ්ඩයේ දායකත්වය ධනාත්මක සහ සාපේක්ෂ වශයෙන් ස්ථායී මට්ටමක පැවතුණි. මූලික උද්ධමනය සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම මධ්‍යයේ, සමස්ත මිල මට්ටම ඉහළ යෑම බොහෝ දුරට ක්‍රමයෙන් සිදු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කො.පා.මි.ද. 2026 වසරේ පළමුවන කාර්තුවේ දී 2.0%ක කාර්තුමය උද්ධමන අගයක් වාර්තා කරමින් තවදුරටත් 3.0%ට වඩා අඩු අගයක පැවතුණි.

---

[5] ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන ගාස්තු යෝජනා මත හෝ පිරිවැය ආවරණ මිලකරණය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ පදනම මත උපකල්පන පදනම් වේ. කෙසේ වුවද, මෑතකාලීනව සිදු කරන ලද ගාස්තු සංශෝධන මගින් පිරිවැය සම්පූර්ණයෙන් පිළිඹිබු කර නොතිබිය හැකි අතර, ලංකා විදුලිබල මණ්ඩලය 2025 වසර සඳහා වාර්තා කරන ලද සමස්ත අලාභය මගින් මෙය යම්තාක් දුරකට පිළිබිඹු වේ.

පරිශිෂ්ටය 1 මගින්, වාර්තා වූ බලශක්ති මිල ගණන්වලට සාපේක්ෂව *උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තා* සඳහා භාවිතා වූ එක් එක් මුදල් ප්‍රතිපත්ති වාරයේ දී බලශක්ති මිල ගණන් සම්බන්ධයෙන් ගන්නා ලද උපකල්පන පිළිබඳ සාරාංශයක් සපයයි.

රූප සටහන 1: කාර්තුමය මතුපිට උද්ධමනය (කො.පා.මි.ද., 2021=100, වාර්ෂික ලක්ෂ්‍යමය, %)



මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 2: මතුපිට සහ මූලික උද්ධමනයේ විචලනයන් (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2023 ජනවාරි මාසයට පෙර දත්ත කො.පා.මි.ද. (2013=100) මත පදනම් වන අතර, 2023 ජනවාරි මාසයේ සිට දත්ත කො.පා.මි.ද. (2021=100) මත පදනම් වේ.

රූප සටහන 3: මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො.පා.මි.ද., 2021=100, වාර්ෂික ලක්ෂ්‍යමය, %)



මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2.2. මේ අතර, මූලික උද්ධමනය 2026 වසරේ පළමුවන කාර්තුවේ දී 2.3%ක අගයක් වාර්තා කරමින් තවදුරටත් පහළ ධන මට්ටම්වල පැවතුණි. 2025 වසරේ හතරවන කාර්තුවට සාපේක්ෂව මූලික උද්ධමනය ද 2026 වසරේ පළමුවන කාර්තුවේ දී සුළු පහළ යෑමක් වාර්තා කළ අතර, ඇතැම් ආහාර මිල ගණන් පහළ යෑම සහ සංඛ්‍යානමය පදනම් බලපෑම ඊට ප්‍රධාන වශයෙන් හේතු විය. පෞද්ගලික අංශයට ලබා දුන් ණය ඉහළ යෑම සහ ආනයන වැඩි වීම වැනි අනෙකුත් දර්ශක මගින් පෙන්නුම් කරන ප්‍රමාණයට වඩා ඉල්ලුම ඉහළ යෑම තරමක් මන්දගාමී බව අඩු මූලික උද්ධමනය මගින් පෙන්නුම් කෙරේ.

2.3. දිගු කාලයක් පුරා සෘණ මට්ටමක පැවති බලශක්ති සහ ඉන්ධන උද්ධමනය, ක්‍රමයෙන් ඉහළ ගොස් ධන අගයක් වාර්තා කළ අතර, 2026 වසරේ පළමුවන කාර්තුවේ දී මතුපිට උද්ධමනය සඳහා දායක විය. 2026 වසරේ මාර්තු මාසයේ දී ක්‍රියාත්මක කරන ලද සැලකිය යුතු ඉන්ධන මිල ගණන් ඉහළ දැමීම මාර්තු මස අග භාගයේ දී සිදුවීම සමඟ එහි පූර්ණ සෘජු බලපෑම් ඇති වීම 2026 වසරේ අප්‍රේල් මාසයේ දී සිදු වීම හේතුවෙන් 2026 වසරේ පළමුවන කාර්තුවේ උද්ධමනය කෙරෙහි සුළු බලපෑමක් පමණක් එල්ල කරන ලදී. ඒ අනුව, බලශක්ති සහ ඉන්ධන උද්ධමනය 2026 වසරේ පළමුවන කාර්තුවේ දී ධන අගයකට පත් වුවද තවදුරටත් පහළ මට්ටම්වල පැවතුණි. මෑතකාලීනව නිරීක්ෂණය කළ සාපේක්ෂ වශයෙන් අඩු උච්චාවචන රටාව අඛණ්ඩව

පවත්වා ගනිමින් සේවා උද්ධමනය ස්ථායීව පැවතුණි. මේ අතර, මතුපිට උද්ධමනය සඳහා නිරත මිල උච්චාවචනය වන ආහාර උද්ධමනය දක්වන දායකත්වය මීට පෙර කාලපරිච්ඡේදවල දී ධන සහ ස්ථායී මට්ටමක පැවතිය ද, එළවළු සහ පොල් මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2026 වසරේ පෙබරවාරි සහ මාර්තු මාසවල දී එය සැලකිය යුතු ලෙස පහළ වැටුණි.

2.4. 2025 වසරේ තුන්වන සහ හතරවන කාර්තුව සඳහා අදාළ වන පරිදි 2026 වසරේ මාර්තු මාසයේ දී නිකුත් කළ වාර්තාවේ දැක්වෙන පුරෝකථන හා සැසඳීමේ දී, 2026 වසරේ මාර්තු මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පුරෝකථනය කළ උද්ධමන ගමන් මග ඉහළ මට්ටමක පවතින අතර, ඒ සඳහා මැදපෙරදිග යුද්ධයත් සමඟ බලශක්ති මිල ගණන් ඉහළ යෑම සහ ප්‍රධාන උපකල්පන කිහිපයක් ආශ්‍රිතව සිදු වූ සංශෝධන හේතු විය. විශේෂයෙන් විදුලි ගාස්තු, ඉන්ධන සහ ගෑස් මිල ගණන් ඉහළ යෑම හා සම්බන්ධ උපකල්පන පෙර වාර්තාවට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. ගෝලීය ප්‍රවණතා පිළිබඳ උපකල්පන, Global Projections Model Network (GPMN) මගින් ලබාදෙන පුරෝකථන මත පදනම් වේ. පෙර වාර්තාවට සාපේක්ෂව, ගෝලීය නිමැවුම්, ගෝලීය මූල්‍ය තත්ත්වයන්, ගෝලීය බනිජ තෙල් සහ ගෝලීය ආහාර මිල ගණන් සම්බන්ධ උපකල්පන ආශ්‍රිතව සිදු වූ වෙනස්කම් සමඟ ගෝලීය ඉදිරි දැක්ම සංශෝධනය විය. ඉහළ ගිය භූ දේශපාලනික අවිනිශ්චිතතා, වෙළඳාම සම්බන්ධයෙන් පවතින ගැටලුකාරී තත්ත්වයන් සහ මූල්‍ය තත්ත්වයන් දැඩිව පැවතීම හේතුවෙන්, වෙනස්වන ගෝලීය තත්ත්වයන් ප්‍රධාන ආර්ථිකයන්හි ආර්ථික ක්‍රියාකාරකම් මත එල්ල කරන බලපෑම පිළිබිඹු කරමින් ගෝලීය ආර්ථික වර්ධනය පෙර පුරෝකථනය කළ මට්ටමට වඩා දුර්වල වනු ඇතැයි අපේක්ෂා කෙරුණි. පෙර වාර්තාවට සාපේක්ෂව, විශේෂයෙන්ම නුදුරුකාලීන භූ දේශපාලනික අවදානම් ඉහළ යෑම පිළිබිඹු කරමින් ගෝලීය බනිජ තෙල් මිල ගණන් සඳහා වූ ගමන් මග සැලකිය යුතු ලෙස ඉහළ දමා ඇත. 2026 සහ 2027 වසරවල දී ගෝලීය ආහාර උද්ධමනය ඉහළ මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. මේ අතර, එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම පෙර පුරෝකථනය කළ කාලයට වඩා ප්‍රමාද වනු ඇතැයි අපේක්ෂා කරන අතර, ප්‍රතිපත්ති පොලී අනුපාතික මැදි කාලීනව ඉහළ මට්ටමක පවතිනු ඇතැයි එමගින් පෙන්නුම් කෙරේ. 2026 වසර සඳහා වන පරිපූරක අයවැය ඇස්තමේන්තුව මත පදනම්ව, 2026 වසර සහ ඉන් පසු කාලය සඳහා වන රාජ්‍ය මූල්‍ය අංශයට අදාළ උපකල්පන පෙර වාර්තාවට සාපේක්ෂව සමස්තයක් ලෙස නොවෙනස්ව පැවති අතර, 2025 වසරේ වාර්තා වූ රාජ්‍ය මූල්‍ය දත්ත ද ඇතුළත් කර ඇත. සමස්තයක් ලෙස, පෙර අපේක්ෂා කළ උද්ධමන ගමන් මග ඉහළ දැමීම කෙරෙහි මෙම සංශෝධන දායක වී ඇත.

3. මහ බැංකුව විසින් ගනු ලබන ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග

3.1. **උද්ධමනය මත ඉල්ලුම් අංශයේ පීඩන අවම කිරීම කෙරෙහි මුදල් ප්‍රතිපත්තිය අවධානය යොමු කරන අතරම සැපයුම් අංශයේ කම්පන ද සමීපව නිරීක්ෂණය කර, ඒවා උද්ධමන අපේක්ෂාවලට සැලකිය යුතු අන්දමින් බලපෑම් කරන්නේ නම් හෝ වක්‍ර බලපෑම් හරහා උද්ධමන ඉදිරි දැක්මෙහි අඛණ්ඩ වෙනස්කම්වලට හේතු වන්නේ නම් ඊට අදාළ ප්‍රතිචාර මහ බැංකුව විසින් ගනු ලබයි.** කෙසේ වෙතත්, එවැනි දිගු කාලීන බලපෑම් නොමැති අවස්ථාවල දී, මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ආර්ථිකයට සම්ප්‍රේෂණය වීමට යම් කාලයක් ගතවන හෙයින්, කෙටි කාලීන සැපයුම් අංශයේ බාධා විසඳීම සඳහා මුදල් ප්‍රතිපත්තිය යොදා ගැනීම ඵලදායී බවින් අඩු වේ.

3.2. **2023 වසරේ ජූනි මාසයේ සිට මහ බැංකුව ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කිරීමෙන් පසු, ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 2025 වසරේ මැයි මාසයේ දී පදනම් අංක 25කින් පහළ දැමීම ද ඇතුළුව, සමස්තයක් ලෙස ප්‍රතිශතාංක 8.00කින් පමණ පහළ දමා ඇත.**[6]

3.3. **2026 වසරේ මාර්තු මාසයේ පැවති මුදල් ප්‍රතිපත්ති වාරයේ දී ඒක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 7.75%ක මට්ටමේ තවදුරටත් පවත්වාගෙන යැමට මහ බැංකුව විසින් තීරණය කරන ලදී.** මැදපෙරදිග කලාපයේ පවතින යුදමය තත්ත්වය හේතුවෙන් ඇති විය හැකි අවිනිශ්චිතතා පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින්, වෙනස්වන දේශීය හා ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම පිළිබඳව මනාව සලකා බැලීමෙන් අනතුරුව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මෙම තීරණයට එළඹිණි. 2025 වසර අවසානයේ දී දිට්වා සුළි කුණාටුවෙන් බලපෑම් එල්ල වුවද, එම වසරේ දී ආර්ථිකය 5%ක ශක්තිමත් මූර්ත වර්ධනයක් වාර්තා කළේය. 2026 වසරේ මුල් කාලයේ ප්‍රධාන ආර්ථික දර්ශක මගින් මෙම වර්ධනය තවදුරටත් පවත්නා බව පෙන්නුම් කරයි. ආනයන වියදම්වලට සාපේක්ෂව ඉහළ ගිය අපනයන ආදායම් මෙන්ම විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සංචාරක ඉපැයීම්වල ඉහළ යැම හේතුවෙන් 2026 වසර මුල් කාලයේ දී විදේශීය අංශය තවදුරටත් ශක්තිමත්ව පැවතුණි. ණය සේවාකරණ ගෙවීම් මධ්‍යයේ වුවද, දළ නිල සංචිත ප්‍රමාණය හිතකර මට්ටමක පැවතුණි. කෙසේ වෙතත්, මැදපෙරදිග පවත්නා යුදමය වාතාවරණය තවදුරටත් පැවතියහොත් එය ඉදිරි කාලයේ දී දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිය. විශේෂයෙන්ම, එය බලශක්ති, සංචාරක, වෙළඳ හා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ හරහා ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ඉදිරි දැක්මට අවදානම් ඇති කළ හැකි වුවද, එම බලපෑම කෙතරම්ද යන වග තවදුරටත්

[6] පෙර පැවති ප්‍රවණතා හා සසඳන විට වත්මන් ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළ මට්ටමක පවතී. තවද, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය (SRR) 2023 අගෝස්තු මාසයේදී 2% දක්වා අඩු කරන ලද අතර, එතැන් සිට එය එම පහළ මට්ටමේම පවත්වාගෙන යනු ලැබීය.

අවිනිශ්චිතව පවතී. 2026 වසර මුල් කාලයේ ශ්‍රී ලංකා රුපියල සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතිය ද, මැදපෙරදිග යුද්ධය ආරම්භ වීමෙන් අනතුරුව, කලාපයේ අනෙකුත් රටවල්වල විනිමය අනුපාතිකයන්ට සමාන ලෙස ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණවීමේ පීඩන නිරීක්ෂණය විය. මෙම අභියෝග මධ්‍යයේ, 2026 වසරේ මුල් කාලය දක්වා පැවති අඩු උද්ධමන මට්ටම, ඉහළ බලශක්ති මිල ගණන් සහ ඒවා උද්ධමනය මත ඇති කරන වක්‍ර බලපෑම් දරාගැනීමට වැඩි අවකාශයක් සලසා දෙයි.

3.4. **මෙම වාතාවරණය තුළ, ආර්ථිකයට එහි උපරිම ධාරිතා මට්ටමට ළඟා වීමට සහාය වෙමින්, උද්ධමනය එහි ඉලක්කය වටා ස්ථායී වීම සාක්ෂාත් කර ගැනීම සඳහා සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සූදානමින් සිටී.** මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා තම මෙහෙයුම් කාලෝචිත සහ සුදුසු ආකාරයෙන් සිදු කරන අතර, අපේක්ෂා කළමනාකරණය කිරීම සඳහා අඛණ්ඩව ක්‍රියාශීලී සන්නිවේදන කටයුතු පවත්වාගෙන යනු ඇත.

4. උද්ධමන ඉලක්කය සපුරා ගනු ලබන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක්

4.1. **මේ දක්වා නිල වශයෙන් නිකුත් කරන ලද නවතම උද්ධමන පුරෝකථනවලට, එනම් 2026 වසරේ මාර්තු මාසයේ මුදල් ප්‍රතිපත්ති පුරෝකථන අනුව, මතුපිට උද්ධමනය 2026 වසරේ දෙවන භාගය වන විට 5%ක උද්ධමන ඉලක්කය වෙත ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** අපේක්ෂා කළ මට්ටමට වඩා ඉන්ධන මිල ඉහළ යෑම, විදුලි ගාස්තු ඉහළ යෑම සහ බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය ඉහළ යෑම නිසා ඇති වූ වක්‍ර බලපෑම් පිළිබිඹු කරමින් උද්ධමනය පෙර පුරෝකථන වාරයට සාපේක්ෂව වැඩි වේගයකින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. පුරෝකථනය කළ නවතම කාර්තුමය මතුපිට උද්ධමනයේ ගමන්මග රූප සටහන 4හි උද්ධමන ව්‍යාප්ති සටහන මගින් දක්වා ඇත. පුරෝකථන උපකල්පන සහ විනිශ්චයන් මත පදනම් වන බැවින්, ඒවා ස්වභාවයෙන්ම අවිනිශ්චිතතාවයට යටත් වන අතර, එම අවිනිශ්චිතතාව ව්‍යාප්ති සටහන මගින් පෙන්නුම් කරනු ලබයි. මතුපිට උද්ධමනය එහි ඉලක්කය වෙත ළඟා වී, එම ඉලක්කයෙන් ප්‍රතිශතාංක ±2ක ආන්තිකය තුළ පවතිනු ඇතැයි කළ තක්සේරුව, පුරෝකථන ව්‍යාප්තියේ මධ්‍යන්‍ය ගමන් මග මත පදනම් වේ. ව්‍යාප්ති සටහන මගින් දැක්වෙන පුරෝකථන ව්‍යාප්තිය මත පදනම්ව, 2026 වසරේ දෙවන කාර්තුව වන විට උද්ධමනය ප්‍රතිශතාංක ±2ක ආන්තිකයේ පැවතීමට ඇති සම්භාවිතාව 45% පමණ වන බවට ඇස්තමේන්තු කර ඇත. ගෝලීය බලශක්ති සහ ප්‍රවාහන මිල ගණන් ඉහළ යෑම මධ්‍යයේ, ආර්ථිකය යථා තත්ත්වයට පත් වෙමින් පැවතීම, ලිහිල් මුදල් ප්‍රතිපත්තිය, සහ ශ්‍රී ලංකා රුපියල ක්‍රමයෙන් අවප්‍රමාණය වීම, මතුපිට උද්ධමනය එහි ඉලක්කගත මට්ටමට ළඟාවීමට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ යටිදැරි උද්ධමන පීඩන මනිනු ලබන මූලික උද්ධමනය, මැදි කාලීනව මතුපිට

උද්ධමන ඉලක්කයට අනුකූල මට්ටමක් කරා ක්‍රමයෙන් ඉහළ ගොස්, සාපේක්ෂව ස්ථායී මට්ටමක පවතිනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, බලශක්ති සහ ප්‍රවාහන සම්බන්ධ මිලෙහි ඇති විය හැකි වක්‍ර බලපෑම් මූලික උද්ධමනයට ද දායක විය හැකි අතර එමගින් සාපේක්ෂව ඉහළ උද්ධමන ගමන් මගක් ඇති කළ හැකිය.

4.2. **ඉහත සඳහන් කළ පරිදි, උද්ධමනය එහි ඉලක්කයට ළඟා වීමට ගත වන කාල සීමාව, 2026 මාර්තු මාසයේ සිදු කළ පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන සහා විනිශ්චයන් මත පදනම් වේ.** මෙම පුරෝකථන ගෝලීය බලශක්ති හා ආහාර මිල පිළිබඳ වන පුරෝකථන, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ අපේක්ෂිත වර්ධනය, රජයේ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම, එක්සත් ජනපද මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මගින් නිරූපණය වන ගෝලීය මූල්‍ය තත්ත්ව සහ විදේශීය ජංගම ගිණුමේ ශේෂය ඇතුළුව විදේශීය අංශයේ අපේක්ෂිත ප්‍රවණතා යනාදී කරුණු මත රඳා පවතී. ඒ අනුව, මෙම උපකල්පනවල සිදුවන සැලකිය යුතු මට්ටමේ වෙනසක් වාර්තා වූ උද්ධමන මාර්ගය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය. විශේෂයෙන්ම, මැදපෙරදිග යුදමය තත්ත්වය සම්බන්ධ ප්‍රවණතා සහ එම හේතුවෙන් බලශක්ති හා වෙළඳ භාණ්ඩ ඇතුළු ගෝලීය මිල ගණන්වල සිදු විය හැකි වෙනස්කම් මගින් පුරෝකථනය කළ උද්ධමන ගමන් මග වෙනස් විය හැකිය.

4.3. ඒ අනුව, සාධක කිහිපයක් හේතුවෙන් වාර්තා වන උද්ධමනය, උද්ධමන පුරෝකථනවලට වඩා ඉහළ යෑමේ අවදානම් පවතී. තීව්‍ර වූ භූ දේශපාලනික අර්බුද, ගෝලීය භාණ්ඩ වෙළඳපොළ, බලශක්ති සැපයුම් සහ නැව් මාර්ග සඳහා බාධා එල්ල කළ හැකිය. මෙම ප්‍රවණතා හේතුවෙන් දැනටමත් ගෝලීය බනිජ තෙල් මිල ගණන් සහ නැව්ගත කිරීමේ පිරිවැය ඉහළ යෑමට හේතු වී ඇති අතර, එය දේශීය බලශක්ති හා ප්‍රවාහන මිල ගණන් මෙන්ම පොහොර මිල ගණන් අපේක්ෂා කළ මට්ටමට වඩා ඉහළ යෑමට හේතු විය හැකි අතර එය කෘෂිකාර්මික නිෂ්පාදන සහ ආහාර මිල ගණන් සඳහා අහිතකර ලෙස බලපෑම් ඇති කරනු ඇත. එයට අමතරව, ශ්‍රී ලංකා රුපියල ඉහළ මට්ටම්වලින් අවප්‍රමාණය වීමට ඇති හැකියාව සහ ඉහළ ණය වර්ධනයේ පසු බලපෑම හේතුවෙන් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉහළ ඉල්ලුම් පීඩන ඇති වීමේ හැකියාව, උද්ධමනය මත තවදුරටත් ඉහළ පීඩන ඇති කළ හැකිය. කෘෂිකාර්මික සහ බලශක්ති අංශයන්ට බලපෑම් ඇති කරමින් නිරන්තරයෙන් සිදුවන අයහපත් කාලගුණික තත්ත්වයන් ද ආහාර හා බලශක්ති උද්ධමනයට ඉහළ පීඩන ඇති කළ හැකිය. මේ අතර, වාර්තා වන උද්ධමනය, උද්ධමන පුරෝකථනවලට වඩා පහළ යෑමේ අවදානම් අතරට, ඉල්ලුම් තත්ත්ව අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා දුර්වලව පැවතීමේ හැකියාව සහ එමගින් මූලික උද්ධමනය යථා තත්ත්වයට පත්වීම අඩු වේගයකින් සිදුවීම, සහ ආහාර මිල ගණන් මත පීඩන ලිහිල් කිරීමට උපකාරී වන කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිදියුණු වීමේ හැකියාව ඇතුළත් වේ. මැදපෙරදිග පවතින යුදමය තත්ත්වයේ නිරන්තර වෙනස්වන ස්වභාවය හේතුවෙන්, මිල ගණන් සහ ආර්ථික ක්‍රියාකාරකම්

කෙරෙහි ඇති බලපෑම අවිනිශ්චිතව පවතී. එවැනි වර්ධනයන් ඉදිරි කාලයේ දී මුදල් ප්‍රතිපත්තිය තීරණය කිරීමේ දී මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් දැඩි අවධානයට ලක් කරනු ඇත. මේ අතර, ලැබෙන තොරතුරුවලට අනුකූලව මහ බැංකුවේ උද්ධමන පුරෝකථන තවදුරටත් සංශෝධනය කරමින් පවත්වාගෙන යනු ඇති අතර, ඒවා මුදල් ප්‍රතිපත්ති සම්බන්ධ සන්නිවේදන මාර්ග හරහා මහජනතාව වෙත සන්නිවේදනය කෙරෙනු ඇත.

රූප සටහන 4: පුරෝකථනය කළ මතුපිට උද්ධමනය

(කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)

2026 වසරේ මාර්තු මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව



මූලය: මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

§ 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා අතර අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම යටතේ උද්ධමන ඉලක්කය (5%) සඳහා එකඟ වී ඇත.

*උද්ධමන ව්‍යාප්ති සටහනෙහි වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වේ. 2026 මාර්තු මස පුරෝකථන වාරයේ දී පැවති සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථනය පදනම් වේ.

සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ.

උද්ධමන ව්‍යාප්ති සටහන මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. රූප සටහනෙන් දැක්වෙන විශ්‍රම්භ ප්‍රාන්තර (confidence intervals, CI) මගින් මැදි කාලීන උද්දමනය විචලනය විය හැකි අගය පරාසයන් දක්වයි. උදාහරණයක් ලෙස, තද කොළ පැහැති ප්‍රදේශය සියයට 50 විශ්‍රම්භ ප්‍රාන්තරය නිරූපණය කරන අතර, එමගින් උද්ධමනයේ සැබෑ අගය මෙම පරාසය තුළ පැවතීමේ සියයට 50ක සම්භාවිතාවක් පවතින බව හඟවනු ලබයි. විශ්‍රම්භ පරාසයන් මගින් උද්ධමනය දීර්ඝ කාලයකට පුරෝකථනය කිරීමේ දී ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයේ ඉහළ යෑම පෙන්නුම් කරයි.

පවත්නා මැද පෙරදිග යුද ගැටුම් තත්ත්වයේ නිරන්තර වෙනස්වන ස්වභාවය සහ එමගින් ගෝලීය සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි එල්ලවන පුළුල් වක්‍ර බලපෑම් මධ්‍යයේ, වත්මන් උද්ධමන ඉදිරි දැක්ම සඳහා ඉහළ අවිනිශ්චිතතාවක් පවතී. ඒ අනුව, පුරෝකථන සඳහා පදනම් වූ තත්ත්වයන්හි සැලකිය යුතු වෙනස්කම් සිදුවුවහොත් මෙම පුරෝකථනවලින් සැලකිය යුතු අපගමනයක් සිදු විය හැකිය.

ඇමුණුම

රූප සටහන 5: කාණ්ඩ අනුව මතුපිට උද්දමනය (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: 2023 ජනවාරි මාසයට පෙර පැවති දත්ත කො.පා.මි.ද.(2013=100), මත පදනම් වන අතර, 2023 ජනවාරි මාසයේ සිට ආරම්භ වන දත්ත කො.පා.මි.ද. (2021=100) මත පදනම් වේ. කො.පා.මි.ද. (2021=100) මත පදනම්ව, වරහන් තුළ පදනම් වර්ෂයේ බර තැබීම සඳහන් කර ඇත.

පරිශිෂ්ටය 1

වාර්තා වූ බලශක්ති මිල ගණන්වලට සාපේක්ෂව *උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාවල* දක්වා ඇති පරිදි එක් එක් මුදල් ප්‍රතිපත්ති වාරයේ දී බලශක්ති මිල ගණන් සම්බන්ධයෙන් ගන්නා ලද උපකල්පන පිළිබඳ සාරාංශය

මුදල් ප්‍රතිපත්ති වාරවල දී යොදා ගන්නා ලද උපකල්පන, පුරෝකථන සිදු කරන කාල සීමාව වන විට පැවති දත්ත උපයෝගී කරගෙන සිදු කරනු ලබයි. විදුලි ගාස්තු සම්බන්ධ උපකල්පන බොහෝ විට ලංකා විදුලිබල මණ්ඩලය මගින් ඉදිරිපත් කරන ලද සහ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම විසින් අනුමත කරන ලද ගාස්තු යෝජනා මත හෝ පිරිවැය ආවරණ මිලකරණය අඛණ්ඩව පවත්වාගෙන යෑම මත පදනම් වේ. දේශීය ඉන්ධන මිල පිළිබඳ උපකල්පන ගෝලීය තෙල් මිල ප්‍රවණතා සහ විනිමය අනුපාතික විචලන මත පදනම් වේ. ගෝලීය ඛනිජ තෙල් මිල පිළිබඳ පුරෝකථන Global Projection Model Network (GPMN) මත පදනම් වන අතර, මෙම පුරෝකථනවල අදාළතාවය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලෝක ආර්ථික ඉදිරි දැක්ම (World Economic Outlook, WEO) ඇතුළු අනෙකුත් පවත්නා මූලාශ්‍ර සමග සසඳා බලනු ලැබේ.

උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාවේ යොමු කාලය: **2024 වසරේ 2වන සහ 3වන කාර්තු**		
(මෙම වාර්තාවේ දක්වා ඇති පුරෝකථන **2024 වසරේ නොවැම්බර් මස මුදල් ප්‍රතිපත්ති වාරය** මත පදනම් වේ)	**උපකල්පනය**	**වාර්තා වූ තත්ත්වය**
	විදුලි ගාස්තු	
	ඉදිරි ආසන්න මාස[7] කිහිපය තුළ කිසිදු වෙනසක් සිදු නොවනු ඇතැයි උපකල්පනය කෙරිණි.	2025 වසරේ ජනවාරි මාසයේ දී විදුලි ගාස්තු සැලකිය යුතු ලෙස අඩු කරන ලදී.
	ඉන්ධන මිල	
	පෙට්‍රල්[8] මිල ගණන් මාස 1-2ක පමණ කාලයකින් පහළ යනු ඇතැයි ද, පසුව මාස 5-6ක පමණ කාලයකින් නැවත ඉහළ යනු ඇතැයි ද අපේක්ෂා කරන ලදී.	පෙට්‍රල් මිල ගණන් ආසන්න මාසයේ දී පහළ ගිය නමුත් එය අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු විය. මාස 5-6ක පමණ කාලයකින් පෙට්‍රල් මිල ගණන් තවදුරටත් පහළ දමන ලදී.
	ඩීසල්[9] මිල ගණන් මාස 5-6ක පමණ කාලයකින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන ලදී.	ආසන්න මාසයේ දී ඩීසල් මිල ගණන් සුළු වශයෙන් වැඩි විය.
	මැදි කාලීනව, ඉන්ධන මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරුණි.	උපකල්පනය කළ පරිදි ප්‍රවණතාවය ආපසු හරවමින් මිල ගණන් ඉහළ යෑම වෙනුවට ගෝලීය ඛනිජ තෙල් මිල ගණන් පහළ යෑම අඛණ්ඩව පැවතුණි.
	LP ගෑස්	
	ඉදිරි මාස කිහිපය තුළ මිල ගණන්වල සුළු වැඩිවීමක් අපේක්ෂා කෙරිණි.	ලිට්‍රෝ ගෑස් මිලෙහි කිසිදු වෙනසක් සිදු නොවිය. ලාෆ්ස් ගෑස් මිල මාස 6කින් පමණ කාලයක දී ඉහළ ගියේය.[10]

[7] අදාළ පුරෝකථන වාරය පැවැත්වෙන මාසයෙන් ආරම්භ වන පරිදි කාල සීමාව මනිනු ලැබේ.
[8] පෙට්‍රල් (ඔක්ටේන් 92)
[9] ඔටෝ ඩීසල් (සුදු ඩීසල්)
[10] කො.පා.මි.ද. පැස තුළ වැඩි ප්‍රතිශතයක් ලිට්‍රෝ ගෑස් සඳහා හිමි වේ.

උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාවේ යොමු කාලය: **2024 වසරේ 3වන සහ 4වන කාර්තු**		
(මෙම වාර්තාවේ දක්වා ඇති පුරෝකථන **2025 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරය** මත පදනම් වේ.)	**උපකල්පන**	**වාර්තා වූ තත්ත්වය**
	විදුලි ගාස්තු	
	2025 වසරේ ජනවාරි මාසයේ විදුලි ගාස්තු අඩු කිරීම පුරෝකථනවලට ඇතුළත් කෙරුණි. ඉදිරි ආසන්න මාස කිහිපය තුළ කිසිදු වෙනසක් සිදු නොවනු ඇතැයි උපකල්පනය කෙරිණි.	2025 වසරේ ජූනි මාසයේ දී විදුලි ගාස්තු ඉහළ දැමීය (2025 දෙවන කාර්තුව අවසානයේ).
	ඉන්ධන මිල	
	නුදුරු මාසවල දී පෙට්‍රල් මිල ගණන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන ලදී.	පෙට්‍රල් මිල ගණන් මාස 4-5ක පමණ කාලයක් ඇතුළත පහළ ගියේය.
	නුදුරු මාසවල දී ඩීසල් මිල ගණන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන ලදී.	ඩීසල් මිල ගණන් මාස 5ක පමණ කාලයක් ඇතුළත පහළ ගියේය.
	මැදි කාලීනව, ඉන්ධන මිල ගණන් සුළු වශයෙන් අඩුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කරන ලදී.	2025 වසරේ දී ගෝලීය ඛනිජ තෙල් මිල අඛණ්ඩව පහළ ගියේය.
	LP ගෑස්	
	මාස 3ක පමණ කාලයකින් මිල සුළු වශයෙන් ඉහළ යනු ඇතැයි ද, පසුව මාස 4ක පමණ කාලයකින් අඩු ප්‍රමාණයකින් මිල පහළ යනු ඇතැයි ද අපේක්ෂා කෙරිණි.	ලාෆ්ස් ගෑස් මිල මාස 4ක පමණ කාලයක් ඇතුළත ඉහළ ගියේය.

උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාවේ යොමු කාලය: **2024 වසරේ 4වන කාර්තුව සහ 2025 වසරේ 1වන කාර්තුව**		
(මෙම වාර්තාවේ දක්වා ඇති පුරෝකථන **2025 වසරේ මැයි මස මුදල් ප්‍රතිපත්ති වාරය** මත පදනම් වේ.)	**උපකල්පන**	**වාර්තා වූ තත්ත්වය**
	විදුලි ගාස්තු	
	2025 වසරේ ජනවාරි මස විදුලි ගාස්තු ඉහළ දැමීමක් අපේක්ෂා කෙරිණි.	2025 ජූනි මාසයේ දී අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා සුළු වශයෙන් අඩු මට්ටමකින් විදුලි ගාස්තු ඉහළ දමන ලදී.
	ඉන්ධන මිල	
	පෙට්‍රල් මිල ගණන් මාස 2-3ක් කාලයක් ඇතුළත පහළ යනු ඇතැයි අපේක්ෂා කරන ලදී.	පෙට්‍රල් මිල මාස 3ක් පමණ ඇතුළත ඉහළ ගිය ද, මාස 5ක කාලයක් ඇතුළත පහළ වැටුණි.

	ඩීසල් මිල ගණන් මාස 2ක පමණ කාලයකින් පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරිණි.	ඩීසල් මිල ගණන් මාස 3ක පමණ කාලයකින් ඉහළ ගිය අතර, මාස 5-6කදී පහළ වැටුණි.
	මැදි කාලීනව, ඉන්ධන මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කෙරිණි.	
	LP ගෑස්	
	මිල ගණන්වල සුළු වශයෙන් පහළ යෑමක් අපේක්ෂා කරන ලදී.	මිල ගණන්වල වෙනසක් දක්නට නොලැබුණි.

උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාවේ යොමු කාලය: **2025 වසරේ 1වන සහ 2වන කාර්තු**		
(මෙම වාර්තාවේ දක්වා ඇති පුරෝකථන **2025 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරය** මත පදනම් වේ.)	**උපකල්පන**	**වාර්තා වූ තත්ත්වය**
	විදුලි ගාස්තු	
	නුදුරු මාසවල දී කිසිදු වෙනසක් අපේක්ෂා නොකෙරුණි.	ගාස්තුවල වෙනසක් දක්නට නොලැබුණි.
	ඉන්ධන මිල	
	පෙට්‍රල් මිල ගණන් මාස 2-3ක් ඇතුළත පහළ යනු ඇතැයි අපේක්ෂා කරන ලදී.	පෙට්‍රල් මිල ගණන් මාස 3කින් සහ නැවත මාස 5කින් පහළ වැටුණි.
	ඩීසල් මිල ගණන් මාස 2-3ක් ඇතුළත පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරිණි.	ඩීසල් මිල ගණන් මාස 3-4ක පමණ කාලයකින් පහළ වැටුණි.
	මැදි කාලීනව, ඉන්ධන මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කරන ලදී.	
	LP ගෑස්	
	මිල ගණන්වල සුළු වශයෙන් පහළ යෑමක් අපේක්ෂා කෙරේ.	මිල ගණන්වල වෙනසක් දක්නට නොලැබුණි.

උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාවේ යොමු කාලය: **2025 වසරේ 2වන සහ 3වන කාර්තු**		
(මෙම වාර්තාවේ දක්වා ඇති පුරෝකථන **2025 වසරේ නොවැම්බර් මස මුදල් ප්‍රතිපත්ති වාරය** මත පදනම් වේ.)	**උපකල්පන**	**වාර්තා වූ තත්ත්වය**
	විදුලි ගාස්තු	
	2026 වසරේ ජනවාරි මස විදුලි ගාස්තු ඉහළ දැමීමක් අපේක්ෂා කෙරිණි.	2026 ජනවාරි මාසයේ දී ගාස්තු සංශෝධනයක් සිදු නොවූ අතර, 2026 වසරේ අප්‍රේල් මස දී විදුලි ගාස්තු ඉහළ දමන ලදී.
	ඉන්ධන මිල	
	පෙට්‍රල් මිල මාස 2-3ක් ඇතුළත දී ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන ලදී.	පෙට්‍රල් මිල මාස 4ක පමණ කාලයක් තුළ සුළු වශයෙන් පහළ ගිය ද, මාස 5-6ක් තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

	ඩීසල් මිල මාස 2-3ක් ඇතුළත ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරිණි.	ඩීසල් මිල මාස 3-4ක් තුළ දී සුළු වශයෙන් වෙනස් වූ නමුත්, මාස 5-6ක දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.
	මැදි කාලීනව, ඉන්ධන මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.	
	LP ගෑස්	
	මිල ගණන්වල වෙනසක් අපේක්ෂා නොකෙරුණි.	මාස 3-6ක කාලයක් ඇතුළත දී මිල ගණන් ඉහළ ගියේය.

උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාවේ යොමු කාලය: **2025 වසරේ 3වන සහ 4වන කාර්තු**		
(මෙම වාර්තාවේ දක්වා ඇති පුරෝකථන **2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරය** මත පදනම් වේ.)	උපකල්පන	වාර්තා වූ තත්ත්වය **(2026 වසරේ මැයි මස මුල දක්වා)**
	විදුලි ගාස්තු	
	නුදුරු මාසවල දී විදුලි ගාස්තුවල වෙනසක් අපේක්ෂා නොකෙරුණි.	2026 අප්‍රේල් මස දී විදුලි ගාස්තු ඉහළ දමමින් සංශෝධනය කෙරුණි.
	ඉන්ධන මිල	
	නුදුරු මාසවල දී පෙට්‍රල් මිල ගණන් පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරිණි.	පෙට්‍රල් මිල ගණන් නුදුරු මාසයේ දී සුළු වශයෙන් පහළ ගිය නමුත්, මාස 3-5ක් තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.
	ඩීසල් මිල ගණන් නුදුරු මාසයේ දී පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරිණි.	ඩීසල් මිල ගණන් නුදුරු මාසයේ දී සුළු වශයෙන් පහළ ගිය නමුත්, මාස 3-5ක් තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.
	මැදි කාලීනව, ඉන්ධන මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කෙරිණි.	
	LP ගෑස්	
	මිල ගණන්වල වෙනස් අපේක්ෂා නොකෙරුණි.	නුදුරු මාසයේ දී මිල ගණන් ඉහළ ගියේය.

උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාවේ යොමු කාලය: **2025 වසරේ 4වන කාර්තුව සහ 2026 වසරේ 1වන කාර්තුව**		
(මෙම වාර්තාවේ දක්වා ඇති පුරෝකථන **2026 වසරේ මාර්තු මස මුදල් ප්‍රතිපත්ති**	උපකල්පන	වාර්තා වූ තත්ත්වය **(2026 වසරේ මැයි මස මුල දක්වා)**
	විදුලි ගාස්තු	
	2026 වසරේ අප්‍රේල් මස විදුලි ගාස්තු ඉහළ දැමීමක් අපේක්ෂා කෙරිණි.	2026 අප්‍රේල් මස දී අපේක්ෂා කළ මට්ටමට වඩා අඩු මට්ටමකින් විදුලි ගාස්තු ඉහළ දමමින් සංශෝධනය කෙරුණි.
	ඉන්ධන මිල	

වාරය මත පදනම් වේ.)	පෙට්‍රල් මිල මාස 3ක දී ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන ලදී.	පෙට්‍රල් මිල මාස 3ක කාලයක් ඇතුළත දී අපේක්ෂා කළ මට්ටමට වඩා අඩු ප්‍රමාණයකින් ඉහළ ගියේය.
	ඩීසල් මිල මාස 3ක දී ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරිණි.	ඩීසල් මිල මාස 3ක කාලයක් ඇතුළත දී අපේක්ෂා කළ මට්ටමට වඩා අඩු ප්‍රමාණයකින් ඉහළ ගියේය.
	මැදි කාලීනව, ඉන්ධන මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.	
	LP ගෑස්	
	ගෑස් මිල ගණන් නුදුරු මාසයේ දී ඉහළ යනු ඇතැයි අපේකෂා කෙරුණි.	නුදුරු මාසවල දී අපේක්ෂා කළ මට්ටමට වඩා වැඩි මිල ඉහළ යෑමක් දක්නට ලැබුණි.